මහේස්ත්‍රාත් අධිකරණය
JUL 1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 11 දරන
# දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 13 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල: ශත 60 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි

## 1987 අංක 11 දරන දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 13 වන දින.]

එල්. ඩී.—ඕ. 20/86.

**දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

"දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද එම පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන ප්‍රයෝජනය සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1987 අංක 11 දරන දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය සංස්ථාගත කිරීම.**

2. මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානයෙහි දැනට සාමාජිකයන් වන තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "දීප ව්‍යාප්ත බෝසත් ළමා සමාජ සංවිධානය" යන අභිධානය සහ නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු ය. තවද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද ඒ නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබාගැනීමේත් පාවිච්චි කිරීමේත් කැමැති පරිදි එය වෙනස් කිරීමේත් පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ**

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ධර්මානුකූල සමාජයක් නිර්මාණය කිරීමේ අරමුණින් බෞද්ධ ජීවන ක්‍රමය හා ආගමික සිරිත් විරිත් පිළිපැදීමට ළමයින්ට ධෛර්ය දීම;

(ආ) ජනතාවට සේවය කිරීමේ කාර්ය සඳහා තමන් තුළ ඇති විවිධ කුසලතා වර්ධනය කර ගැනීමට බාලක බාලිකාවන්ට මග පෙන්වීම;

(ඇ) සමාජ සේවා කටයුතු සංවිධානය කිරීම; සහ

(ඈ) සංස්කෘතික කටයුතුවල නිරත වීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, ස්වකීය අර මුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස් යොදා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා අස්කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු මෙහෙයවීම.

5. (1) සංස්ථාවේ නිලධරයන්ගෙන් ද රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ හා ඒ රීතිවලට අනුව තෝරා පත් කරගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් ද සමන්විත කළමනාකාර කාරක සභාවක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන සංගමයේ කළමනාකාර කාරක සභාව සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, සමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා බේරුම් කළ යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, ආයක මුදල් සහ ප්‍රදානයන් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමැති පත්‍රයකින් දේපළ නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙන් බලය සහ ශක්‍යතාව සංස්ථාවට තිබෙන අතර ඒ සියලු දේපළ, ඒවා විකිණීමට උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතුය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ මුද්‍රාව සභාපතිවරයා හෝ සභාපතිවරයා නොමැති විටක උප සභාපතිවරයකු සහ ලේකම්වරයා ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් ඉදිරිපිට මුද්‍රාව තැබූ බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගෙ අත්සන් කිරීමට බාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මඟින් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.